Sinhala Synthesis

# SYNTHESIS

3rd Biannual Report (January-June 2026)

## Monitoring the Implementation of the Government's Manifesto

***'A Thriving Nation-A Beautiful Life'***

PAFFREL

මාර්තු
மார்ச்
MARCH 12
March 12 Movement

# සංක්ෂිප්තය

## තෙවන අර්ධ වාර්ෂික වාර්තාව (ජනවාරි-ජූනි 2026)

## *"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්"* රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාවට නැංවෙන ආකාරය පිළිබඳව සිදු කෙරෙන අධීක්ෂණය

පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය

## හැඳින්වීම

පැෆ්රල් සංවිධානය, මාර්තු 12 ව්‍යාපාරය සමඟ එක්ව විනිවිදභාවය, වගවීම සහ ප්‍රතිඵල මත පදනම් වූ පාලනය ප්‍රවර්ධනය කිරීම පිණිස "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිබඳව අඛණ්ඩ ස්වාධීන අධීක්ෂණයක නිරත විය. 2024 ජනාධිපතිවරණයෙන් සහ පාර්ලිමේන්තු මැතිවරණයෙන් අනතුරුව, සිය දෙවන වර්ෂය තුළ (2026 ජනවාරි-ජූනි) පළමු මාස හය තුළ රජයේ ක්‍රියාමාර්ග ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු සමඟ කෙතරම් දුරට සමපාත වන්නේද යන ඇගයීම මෙම සංක්ෂිප්ත වාර්තාවෙන් ඉදිරිපත් කෙරේ. මූලධර්ම, නිර්ණායක සහ උපකල්පන සහිත ව්‍යුහගත රාමුවක් මත පදනම්ව, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළත් පොරොන්දුවල දිශානතීන් සහ එහි ප්‍රතිපත්තිමය මඟපෙන්වීම්, කැබිනට් තීරණ, 2026 ජාතික අයවැය, පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග සහ විශේෂයෙන්ම 'දිට්වා' සුළි කුණාටුවෙන් පසුව රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කෙරෙහි මෙකී අධීක්ෂණයේ දී අවධානය යොමු විය.

## පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්

රජයේ ප්‍රධාන දැක්ම වන්නේ: පරිසමාප්ත ජීවිතයක්-සුවපහසු රටක් (ප්‍රජා), සුරක්ෂිත රටක් සඳහා ගෞරවනීය ජීවිතයක් (සමාජ), පොහොසත් ජාතියක්-නවීන ජීවිතයක් (ආර්ථික) සහ නොසැලෙන රටක්-අභිමානවත් ජීවිතයක් (ආණ්ඩුකරණ) සහතික කිරීමයි. මෙකී සිවු වැදෑරුම් මූලික අපේක්ෂාවන් මඟින් ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර (National Key Result Areas) සාක්ෂාත් කර ගැනීම පිණිස මඟපෙන්වීමේ මෙහෙයුම් ලෙස ක්‍රියා කරයි. මෙකී දැක්ම ක්‍රියාවට නැංවීම උදෙසා, පුළුල් ප්‍රතිපත්තිමය ඉලක්ක මැනිය හැකි ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීම පිණිස, ව්‍යුහගත රාමුවක් සම්පාදනය කරමින්, උප-ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර (ඉලක්ක) 39 ක් හඳුනාගෙන තිබේ. සාධනීය පියවරක් ඉදිරියට තබමින් සිය ප්‍රතිපත්ති ප්‍රකාශනය, **'ජාතික ප්‍රතිපත්ති රාමුව'**[1] ලෙස නිල වශයෙන් පිළිගැනීමටත්, එහි අභ්‍යන්තර අධීක්ෂණ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීමටත්, රජය කටයුතු කොට තිබේ. මෙම ස්වාධීන මුලපිරීම තුළින් විනිවිදභාවය සහ ප්‍රතිඵල මත පදනම් වූ පාලනයක් උදෙසා අර්ථාන්විත සහයෝගයක් ලබා දීමට අපේක්ෂා කෙරේ.

## ක්‍රමවේදය

තෙවන අදියර මඟින් විධායක සහ කැබිනට් තීරණ, පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග, අයවැය වෙන්කිරීම් සහ අමාත්‍යාංශ කාර්යසාධනය ඇතුළු ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දර්ශක භාවිත කරමින්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එන කැපවීම්වලට අනුකූලව රජයේ ක්‍රියාමාර්ග ඇගයීමට ලක් කෙරේ. මෙහිදී ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය පිළිබඳ සංවිධානයේ සංවර්ධන ආධාර කමිටුවේ (OECD-DAC) උචිතබව, කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව යන නිර්ණායක උපයෝගී කර ගනිමින්[2] අදාළත්වය, ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, සම්පත් භාවිතය සහ අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම යන්න පරීක්ෂා කොට තිබේ. සමස්ථ බලපෑම සහ තිරසාරභාවය මැන බැලීම සඳහා දීර්ඝ කාලීන සාක්ෂි අවශ්‍ය වන බැවින්, 'බලපෑම' සහ 'තිරසාරභාවය' යන නිර්ණායකයන් මෙම අදියරේදී ඇගයීමට ලක් නොකෙරේ.

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවල දිශානතිය

ප්‍රතිපත්ති ප්‍රකාශනය අධීක්ෂණය කිරීමේ තෙවන අදියර මඟින් එහි එන පොරොන්දුවල දිශානතිය විශ්ලේෂණය කළ අතර, ඒ අනුව ප්‍රතිපත්තිමය මූලිකත්වයක් සහිත පොරොන්දු 407 ක් (31%), සංවර්ධන මූලිකත්වයක් සහිත පොරොන්දු 523 ක් (39%) සහ ප්‍රතිපත්තිමය මෙන්ම සංවර්ධනමය යන ද්විත්ව අංශයන්ගෙන් සමන්විත පොරොන්දු 403 ක් (30%) ලෙස සමස්ත පොරොන්දු 1,333 ක් වර්ගීකරණය කරන ලදී.




*රූප සටහන 1 ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළත් පොරොන්දුවල දිශානතිය*

---

[1] https://www.treasury.gov.lk/si/api/file/171f600c-4459-4b2c-a22f-1bd96232abfd

[2] මෙම නිර්ණායක මඟින් කිසියම් මැදිහත්වීමක (ප්‍රතිපත්තියක, උපායමාර්ගයක, වැඩසටහනක, ව්‍යාපෘතියක හෝ ක්‍රියාකාරකමක) වටිනාකම හෝ යෝග්‍යත්වය තීරණය කිරීම සඳහා භාවිත වන සම්මත රාමුවක් සපයයි. ඇගයීම් සම්බන්ධ තීරණ ලබා ගැනීම සඳහා වන පදනම ලෙස මේවා ක්‍රියාත්මක වේ.

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මඟින් ආණ්ඩුකරණය, රාජ්‍ය පරිපාලනය, සාමාජීය සංවර්ධනය, ආර්ථික පරිවර්තනය, පාරිසරික තිරසාරභාවය සහ ජාතික සංවර්ධනය යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි **පුළුල් සහ බහු- ආංශික ප්‍රතිපත්ති රාමුවක්** ඉදිරිපත් කරයි. මෙම සංක්ෂිප්ත වාර්තාව සඳහා, එහි ප්‍රධාන කැපවීම් පහත පරිදි සාරාංශ කළ හැකිය:

| **ක්ෂේත්‍රය** | **ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා** |
|---|---|
| අධ්‍යාපන | "සංස්කෘතිය යනු පුළුල් හා ගතික ක්ෂේත්‍රයක්" ලෙස හඳුනාගන්නා අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීම. |
| සෞඛ්‍ය | "සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයෝජන ඉහළ නැංවීම" සහ එය විධිමත් මෙන්ම ප්‍රවේශ විය හැකි මහජන සේවාවක් ලෙස ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම. |
| ක්‍රීඩා | ජාතික අභිමානය නැවත ඇති කිරීම සහ නිරෝගී, විනයගරුක ජනගහණයක් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් "ක්‍රීඩා සහ ශාරීරික සුවතා ප්‍රතිපත්තියක්" ක්‍රියාත්මක කිරීම. |
| පරිසර | "ජෛව විවිධත්වයේ නිරෝගී පැවැත්ම තහවුරු කරන තිරසාර පරිසරයක්" යන දැක්ම මත පදනම්ව කටයුතු කිරීම. |
| ජනමාධ්‍ය | සුදුසු මාධ්‍ය ප්‍රතිපත්ති රාමුවක් ස්ථාපිත කිරීම. |
| විශ්‍රාම වැටුප් | දිවයිනේ සියලුම වැඩකරන ජනතාව සඳහා අදාළ වන පරිපූර්ණ විශ්‍රාම වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. |
| කම්කරු | පරිපූර්ණ කම්කරු ප්‍රතිපත්තියක් සූත්‍රගත කිරීම සහ ක්‍රියාත්මක කිරීම. |
| කාන්තා | කාන්තාවන් මුහුණ දෙන බර සහ පීඩනය අවම කරන රාජ්‍ය සේවාවන් සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සඳහා ප්‍රමුඛතාව ලබා දීම. |
| ළමා | "ළමා ආරක්ෂණය සහ සුබසාධනය" පිළිබඳ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ ළමුන් සුරක්ෂිත කිරීම උදෙසා පරිපූර්ණ ප්‍රවේශයක් අනුගමනය කිරීම. |
| ආබාධිත තැනැත්තන් | සමාජය තුළ සමාන පදනමින් සහභාගී වීමට "ආබාධිත තැනැත්තන්ට" ඇති අයිතිවාසිකම් පිළිගැනීම සහ සුරක්ෂිත කිරීම. |
| ආර්ථික ප්‍රතිපත්තිය | "නිෂ්පාදනය පදනම් කරගත් ආර්ථිකයක්" ගොඩනැගීමේ ශක්‍යතාවය හඳුනාගැනීම. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම. |
| බදු ප්‍රතිපත්තිය | බදු ප්‍රතිපත්ති සම්පාධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහාම වෙන්වූ ආයතනික ඒකකයක් ස්ථාපිත කිරීම. |
| මුදල් ප්‍රතිපත්තිය | විදේශ විනිමය වෙළඳපොළ ඇතුළු මූල්‍ය වෙළඳපොළ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා "ප්‍රතිපත්ති පොලී අනුපාතික" ස්ථාවර කිරීම. |
| වෙළඳ | ආනයන ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම. |
| කෘෂිකර්ම | පවතින තත්ත්වයන් සලකා බලමින් සම්පාදනය කර ඇති අතර, කෘෂිකාර්මික නිෂ්පාදනය සහ ආදායම ඉහළ නැංවීම. |
| ධීවර | විද්‍යාත්මක හා ප්‍රායෝගික ප්‍රවේශයන් භාවිත කරමින් "තිරසාර හා පාරිසරික වගකීමෙන් යුක්තව" ධීවර ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම. |
| සංචාරක | සංචාරක කර්මාන්තය සඳහා වන ප්‍රතිපත්ති සංවර්ධනය සහ සම්පාදනය කිරීමට සහාය වීම පිණිස "සංචාරක ප්‍රතිපත්ති සම්පාදක මණ්ඩලයක් (TPFC)" ස්ථාපිත කිරීම. |
| කර්මාන්ත ප්‍රතිපත්තිය | "ජාතික කර්මාන්ත ප්‍රතිපත්ති රාමුවක්" ක්‍රියාත්මක කිරීම. |
| ඩිජිටල් සහ කෘත්‍රිම බුද්ධිය (AI) | ජාතික කෘත්‍රිම බුද්ධි (AI) ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. |
| බලශක්ති | පරිසරය සුරකිමින් අනාගත පරම්පරාව සඳහා සම්පත් ආරක්ෂා කරන අතරම ගෝලීය ආර්ථිකයට දායක වීම. |
| සාගර | සාගර සම්පත් තිරසාර ලෙස භාවිත කිරීම තහවුරු කිරීම සඳහා "සංකලිත සාගර ප්‍රතිපත්තියක් සහ පාලන රාමුවක්" යෝජනා කිරීම. |
| විදුලි සංදේශ | රැහැන් සහිත සහ රැහැන් රහිත විදුලි සංදේශ ක්ෂේත්‍ර ඇතුළත්ව, ප්‍රතිපත්ති රාමුව මඟින් පුළුල් "සන්නිවේදන ක්ෂේත්‍රයක්" ආවරණය කෙරේ. |
| ඉඩම් | ඉඩම් භාවිතයට අදාළ ප්‍රතිපත්ති සහ මූලධර්මවලට අනුකූලව "ඉඩම් සම්පත් කළමනාකරණය සහ සංරක්ෂණය" යෝජනා කිරීම. |
| විදේශ ප්‍රතිපත්තිය | ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික "නොබැඳි" විදේශ ප්‍රතිපත්තිය මත පදනම් වන අතර, ජාතික යහපත විදේශ ප්‍රතිපත්තියේ පදනම ලෙස හඳුනාගැනීම. |
| ආරක්ෂක ප්‍රතිපත්තිය | "ජාතික තොරතුරු සහ සයිබර් ආරක්ෂණ පද්ධති" ශක්තිමත් කිරීම. |
| ජාතික භාෂා ප්‍රතිපත්තිය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන සංශෝධනය යටතේ පිළිගෙන ඇති ජාතික භාෂා ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම. |
| ආණ්ඩුකරණය | දිගුකාලීන සමාජයීය හා ව්‍යුහගත බෙදීම් ජයගැනීමේ සහ සිංහල, දෙමළ, මුස්ලිම් සහ වතු ප්‍රජාවන් ඇතුළු සියලුම ජනවාර්ගික හා සමාජීය ප්‍රජාවන් අන්තර්ග්‍රහණය කරගන්නා "එක්සත් ශ්‍රී ලාංකේය අනන්‍යතාවක්" ගොඩනැගීමේ අවශ්‍යතාව හඳුනාගැනීම. |

## කැබිනට් තීරණ සම්බන්ධ ඇගයීම

2026 ජනවාරි-ජූනි කාලසීමාව තුළ, අධීක්ෂණ කණ්ඩායම විසින් කැබිනට් තීරණ 381 ක් පරීක්ෂා කරන ලදී. එහිදී ව්‍යවස්ථාපිත තීරණ 24 ක් ඉවත් කිරීමෙන් අනතුරුව, කැබිනට් තීරණ 357 ක් ඇගයීමට ලක් කෙරිණි. ඉන් තීරණ 92ක් (26%) ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එන කැපවීම්වලට 'අතිශයින් උචිත' ලෙසද, තීරණ 81 ක් (23%) 'උචිත' ලෙසද, තීරණ 77 ක් 'අර්ධ වශයෙන් උචිත' ලෙසද ඇගයීමට පාත්‍ර වූ අතර, තීරණ 107 ක් (30%) ප්‍රතිපත්ති ප්‍රකාශනය සමඟ කිසිදු සබඳතාවක් නොමැති තීරණ ලෙස හඳුනාගන්නා ලදී.




*රූප සටහන 2 ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවලට කැබිනට් තීරණවල අනුකූලතාවයේ ප්‍රතිශතයන්*

කැබිනට් තීරණ ගැනීමේ ක්‍රියාවලිය විශේෂයෙන්ම ආර්ථික කළමනාකරණය, යටිතල පහසුකම්, කෘෂිකර්මය සහ ඉඩම්, සහ සෞඛ්‍ය වැනි ක්ෂේත්‍ර කෙරෙහි වැඩි වශයෙන් අවධානය යොමු කර තිබුණි. එහිදී වැඩිම කැබිනට් තීරණ සංඛ්‍යාවක් එනම් තීරණ 56 ක් (15.7%) මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ලබාගෙන පැවති අතර, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය තීරණ 51 ක් (14.3%) ලබා ගනිමින් දෙවන ස්ථානයේ පසුවිය.

## පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග

මෙම කාලසීමාව තුළ ධීවර හා ජලජ ජීවී වගාව, හරිත හයිඩ්‍රජන්, ඩිජිටල්කරණය, කාන්තාවන් සහ ළමුන් සුරක්ෂිත කිරීම සහ ඉඩම් ඩිජිටල්කරණය වැනි ක්ෂේත්‍රවල සිදුවූ ප්‍රතිපත්තිමය සහ ව්‍යවස්ථාපිත ක්‍රියාකාරකම් ද මෙම වාර්තාව මඟින් හඳුනා ගනී. කෙසේ වුවද, ප්‍රතිපත්ති, පනත් හෝ ආයතනික යාන්ත්‍රණයන් සම්මත කරගැනීම පමණක් මැතිවරණ පොරොන්දුවක් ඉටුකිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු බව වාර්තාව අවධාරණය කරයි.

2026 ජනවාරි-ජූනි කාලසීමාව තුළ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනත් 15 ක් වාර්තාව මඟින් සමාලෝචනය කළ අතර, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළත් පොරොන්දු සහ පුළුල් ප්‍රතිපත්තිමය අරමුණු සමඟ ඒවායේ ඇති අනුකූලතාව ඇගයීමට ලක් කරන ලදී. එහිදී පනත් 07ක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එන සුවිශේෂී පොරොන්දු සමඟ සම්පාත වූ අතර, පනත් 04 ක් අර්ධ වශයෙන් හෝ වක්‍රාකාරයෙන් අදාළ වන බවත්, තවත් පනත් 04ක් හඳුනාගත් ප්‍රතිපත්තිමය කැපවීම් සමඟ සෘජු සබඳතාවක් නොමැති බවත් තක්සේරු කෙරිණි. තවද, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තු විශේෂ කාරක සභා තුනක් පිහිටුවීම ද මෙම අධීක්ෂණයේදී සලකා බැලිණි. ඒ අනුව:

- පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ;
- පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය; සහ
- ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන්හි වසන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ඡන්ද අයිතිය සුරක්ෂිත කිරීම; මෙයට ඇතළත් විය.

මෙකී ක්‍රියාකාරකම් ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වය සහ මැතිවරණ ප්‍රතිසංස්කරණ අතින් ගත් කල ක්‍රියාත්මක මට්ටමේ ප්‍රගතියක් ලෙස වාර්තාව පිළිගන්නා අතරම, ඒවායේ සැබෑ දායකත්වය රඳා පවතින්නේ ඉදිරිපත් කරනු ලබන යෝජනා සහ ඉන් අනතුරුව ගන්නා ව්‍යවස්ථාපිත හා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මත බව පෙන්වා දෙයි.

## 2026 ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඇගයීම

පවතින අමාත්‍යාංශ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සහ ත්‍රෛමාසික ප්‍රගති වාර්තා ඔස්සේ අධීක්ෂණ කණ්ඩායම විසින් 2026 ජාතික අයවැය පරීක්ෂාවට ලක් කරන ලදී. 2026 ජාතික අයවැය මඟින් පුනරාවර්තන වියදම් 64%ක් සහ ප්‍රාග්ධන වියදම් 36%ක් ඇතුළත්ව රුපියල් බිලියන 8,980ක පමණ සමස්ථ වියදමක් වෙන්කර ඇත. දෙවන කාර්තුව අවසන් වන විට, සමුච්චිත වියදම රුපියල් බිලියන 4,111.16ක් දක්වා ළඟා වී පැවති අතර, එය වාර්ෂික වෙන්කිරීමෙන් 46%ක් පමණ නියෝජනය කරන්නකි.




*රූප සටහන 3 සමස්ථ වියදම එදිරිව 2026 අයවැය  රූපසටහන*




*රූප සටහන 4 2 වන කාර්තුව අවසානයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් ප්‍රගතිය*

කෙසේ වෙතත්, අමාත්‍යාංශවල ප්‍රගති තොරතුරු ලබාගැනීමේදී පැවැති බාධාවන් හේතුවෙන් එක් එක් ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දුවලට අදාළව භෞතික සහ ප්‍රතිඵල මට්ටමේ ප්‍රගතිය තහවුරු කරගැනීමේදී සීමාවන්ට මුහුණ දීමට අධීක්ෂණ කණ්ඩායමට සිදුවිය. අමාත්‍යාංශ 25කින් අවශ්‍ය ලේඛන ලැබීමේ තත්ත්වය පහත පරිදි වේ:

| **අවශ්‍ය ලේඛනය** | **සම්පූර්ණයෙන් ලැබී ඇත** | **අර්ධ වශයෙන් ලැබී ඇත** |
|---|---|---|
| උපායමාර්ගික සැලසුම (2025-2029)) | අමාත්‍යාංශ 1 යි | වාර්තා වී නොමැත |
| වාර්ෂික ක්‍රියාකාරී (ක්‍රියාත්මක කිරීමේ) සැලසුම 2026 | අමාත්‍යාංශ 15 යි | අමාත්‍යාංශ 2 යි |
| පළමු කාර්තුමය ප්‍රගති වාර්තාව (2026 ජනවාරි-මාර්තු) | අමාත්‍යාංශ 11 යි | අමාත්‍යාංශ 4 යි |
| දෙවන ත්‍රෛමාසික ප්‍රගති වාර්තාව (2026 අප්‍රේල්-ජූනි) | අමාත්‍යාංශ 6 යි | අමාත්‍යාංශ 4 යි |

ප්‍රගති වාර්තා ලබාදීමේ පැවැති හිඩැස් හේතුවෙන්, මෙම තක්සේරුව ලැබුණු වාර්තා පදනම් කොට ගනිමින් ප්‍රධාන වශයෙන් සිදු කළ අතර, පවතින නිල ලේඛන සහ තොරතුරු මඟින් එය තවදුරටත් පෝෂණය කරන ලදී. එබැවින් මෙම සොයාගැනීම් මඟින් පවතින සාක්ෂි පිළිඹිමු කරන අතරම, අසම්පූර්ණ වාර්තාකරණය සහ තොරතුරු හිඩැස් හේතුවෙන් පැන නැඟුණු සීමාවන් ද පිළිගනු ලබයි.

## නිරීක්ෂණ

2026 ජනවාරි-ජූනි කාලසීමාව තුළ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය කිරීමේ  දී මිශ්‍ර ප්‍රතිඵලවලින් යුත්  ප්‍රගතියක් පෙන්නුම් කරයි. එහිදී රජයේ මූලපිරීම් ගණනාවක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණු දෙසට ගමන් කරන  ආකාරය පෙන්නුම් කරන අතර, තවත් ප්‍රධාන පෙළේ පොරොන්දු කිහිපයක්ම තවමත් පවතිනුයේ  ප්‍රතිපත්තිමය, ව්‍යවස්ථාපිත හෝ සූදානම් වීමේ අදියර තුළය. සමස්ථයක් ලෙස ප්‍රතිපත්ති, ව්‍යවස්ථාපිත තත්ත්වයන්, ආයතනික යාන්ත්‍රණ සහ අයවැය වෙන්කිරීම් සංවර්ධනය කිරීම කෙරෙහි රජයේ ක්‍රියාමාර්ග වැඩි වශයෙන් යොමු වී ඇති බවට  සාක්ෂි මඟින් පැහැදිලි වන අතර, කෙසේ වෙතත්, රජය විසින්  ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සහ පුරවැසියන් උදෙසා මැනිය හැකි ප්‍රතිඵල හා ප්‍රතඵල සාක්ෂාත් කර පෙන්වීම අතර තවමත් සැලකිය යුතු පරතරයක් පවතී.

- නිවාස ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, දිළිඳුකම පිටුදැකීම, අධ්‍යාපනය, කාන්තා සවිබල ගැන්වීම, ළමා ආරක්ෂණය, දූෂණ විරෝධී පියවර, පාරිසරික පාලනය සහ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාව පිළිබඳ පනත නැවත සමාලෝචනය කිරීම ඇතුළු ක්ෂේත්‍ර කිහිපයක ප්‍රගතියක් දක්නට ලැබේ. ජාතික නිවාස ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම මඟින් විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී සහ වතු ප්‍රජාව අතර නිවාස අවශ්‍යතා විසඳීමට අවශ්‍ය පදනම සපයන අතර, 'ප්‍රජාශක්ති' වැඩසටහන සහ ඊට අනුබද්ධ ග්‍රාමීය සංවර්ධන මූලපිරීම් මඟින් දිළිඳුකම අවම කිරීම සඳහා සැලකිය යුතු ආයෝජනයක් සිදු කොට තිබේ.
- එමෙන්ම, පීඩාවට පත් සිසුන්ට සහය වීම, ආර්තව සෞඛ්‍යය, ජීවිත කාලය මුළුල්ලේ ඉගෙනීම, කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සහ ළමා ආරක්ෂණය උදෙසා වන පියවරයන් මඟින් පුළුල් ප්‍රතිපත්ති ප්‍රකාශන අරමුණු වැඩසටහන් සහ ආයතනික මැදිහත්වීම් බවට පරිවර්තනය කිරීමට දරණ උත්සාහයන් පෙන්නුම් කරයි. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාව පිළිබඳ පනත වෙනුවට නව පනතක් යෝජනා කිරීම ද භාෂණයේ නිදහස පිළිබඳ කැපවීම දෙසට පියවරක් තැබූ බවට නිරූපණය කරන්නකි.
- ඒ අතර, පොරොන්දු කිහිපයක්ම අර්ධ වශයෙන් හෝ සීමිත මට්ටමින් ක්‍රියාත්මක වන බව පෙන්නුම් කරයි. ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත මඟින් නියාමන රාමුවක් ස්ථාපිත කරන නමුත්, ණය ගන්නන්, විශේෂයෙන්ම අධික පොලී ණයවලින් පීඩාවට පත් කාන්තාවන් ආරක්ෂා කිරීමට අදාළව ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති නිශ්චිත අරමුණ එයින් කොතෙක් දුරට ඉටු කරන්නේද යන්න පිළිබඳව ගැටලු ඉතිරිව පවතී. එකතු කළ අගය මත බදු (VAT) ප්‍රතිසංස්කරණ මඟින් ද  හඳුනාගත් අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සඳහා 0% ක VAT බදු අනුපාතයක් ලබාදීම සඳහා වූ ප්‍රතිපත්තිමය යෝජනාව තවමත් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නැත.
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ (CIABOC) ශාඛා කාර්යාල සෑම දිස්ත්‍රික්කයකම ස්ථාපිත කිරීම සහ මාස හයට වඩා කල් ගතවී ඇති පැමිණිලි පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සම්බන්ධයෙන් වූ පොරොන්දු ක්‍රියාත්මක කළ බවට පැහැදිලි සාක්ෂි නොමැත. එමෙන්ම, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සහ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වාදීම සඳහා වන මාර්ග සිතියමක්  වාර්තාකරණ කාලසීමාව තුළ ප්‍රසිද්ධියට පත්කර නොතිබුණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහාය ලබන වැඩසටහන රජය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, විකල්ප ණය තිරසාරත්ව විශ්ලේෂණයක්  හෝ පරිපූර්ණ විදේශ ණය විගණනයක් පිළිබඳ ප්‍රසිද්ධ සාක්ෂි නොමැතිව සිදුවන බැවින්, අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම්වලට අනුව ඒ පිළිබඳව අඛණ්ඩ අධීක්ෂණයක් අවශ්‍ය වේ.
- තොරතුරුවල විනිවිදභාවය සහ විශ්වාසදායී තොරතුරු ලබාගැනීමට තිබෙන හැකියාව හරස්කඩ අභියෝගයක් ලෙස මෙම අධීක්ෂණය මඟින් තවදුරටත් හඳුනා ගනී. 2026 අයවැය, 'දිට්වා' සුළි කුණාටුවෙන් පසු යථාවත් කිරීම, දිළිඳුකම අවම කිරීමේ

වැඩසටහන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසි පොලී අනුපාතික සම්බන්ධ පොරොන්දු ඇගයීමේදී මෙය විශේෂයෙන්ම පැහැදිලි වන්නකි. ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ පරිපූර්ණ සහ කාලෝචිත තොරතුරු නොමැති වීම හේතුවෙන් රජයේ මැදිහත්වීම් මඟින් අපේක්ෂිත ප්‍රතිදානයන් සහ ප්‍රතිඵල සාක්ෂාත් කර ගන්නේද යන්න තීරණය කිරීමට ස්වාධීන පාර්ශ්වකරුවන්ට සහ පුරවැසියන්ට අපහසු වේ. 'දිට්වා' සුළි කුණාටුවෙන් පසු යථා තත්ත්වයට පත්කිරීම සම්බන්ධව, ක්‍රියාමාර්ග සහ කැබිනට් තීරණ රාශියක් ආරම්භ කළද, ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පරිපූර්ණ සමාලෝචනයක් නොමැති වීම හේතුවෙන් බලපෑමට ලක්වූ ප්‍රජාවන් කෙරෙහි ඒවායේ ඵලදායීතාව, ආවරණය සහ බලපෑම තක්සේරු කිරීම සීමා වේ.

- ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථාපිත ක්‍රියාවලීන්හිදී අර්ථවත් ලෙස මහජනතාවගෙන් කරුණු විමසීම සහ පාර්ශ්වකරුවන් සහභාගී කර ගැනීමේ අවශ්‍යතාවයද තවත් හරස්කඩ කරුණක් ලෙස ඉස්මතු වන්නකි. ක්ෂුද්‍ර මූල්‍ය නියාමනය, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) වෙනුවට යෝජිත පනත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සහ පළාත් රෝහල් මධ්‍යගත කිරීම සම්බන්ධයෙන් හඳුනාගත් ගැටලු මඟින් විෂය නිපුණතාව, පාර්ශ්වකරුවන්ගේ අදහස් සහ ප්‍රජා මට්ටමේ සාක්ෂි ඇතුළත් කිරීමේ වැදගත්කම පෙන්නුම් කරයි. විශේෂයෙන්ම, මූලික අයිතිවාසිකම්, බලය බෙදීම සහ අගතියට පත්විය හැකි කණ්ඩායම් කෙරෙහි බලපාන ප්‍රතිසංස්කරණ සඳහා විනිවිදභාවයෙන් යුත් ක්‍රියාවලීන් සහ පැහැදිලි සාධාරණීකරණයන් අවශ්‍ය වේ.

## දිළිඳුකම පිටුදැකීම පිළිබඳ මූලික නිරීක්ෂණ

අධීක්ෂණයෙන් මතුවන මූලික නිරීක්ෂණයක් වන්නේ 'අස්වැසුම' සහ අනෙකුත් සමාජ ආධාර ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාවේ වාර්තාගත පහළ යාමයි. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව, 2025 දී අස්වැසුම ප්‍රතිලාභීන් සංඛ්‍යාව මිලියන 2.4ක් වූ අතර එය මිලියන 1.2 දක්වා එනම් 50%කින් පමණ පහත වැටී ඇති බව වාර්තා වේ. ඒ අතරම, මෙම කාර්යය සඳහා ජාතික අයවැය මඟින් වෙන්කළ ප්‍රතිපාදන රුපියල් මිලියන 16,000 සිට රුපියල් මිලියන 15,000 දක්වා පහත වැටී ඇති බව ද වාර්තා වේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාවේ මෙවැනි සැලකිය යුතු අඩුවීමක් මඟින් ගෘහස්ථ ආර්ථික තත්ත්වයන්ගේ දියුණුවක් සහ සමාජ ආධාර මත යැපීම අඩුවීමක් පෙන්නුම් කළ හැකි වුවද, දිළිඳුකම සාර්ථක ලෙස අවම කල බවට සාක්ෂියක් ලෙස එය පමණක් සැලකිය නොහැක. තවදුරටත් ආධාර නොලබන මිලියන 1.2ක් පමණ වන ගෘහ ඒකක සැබවින්ම දිළිඳුකමින් මිදී ඇත්ද යන්න තීරණය කිරීමට සහ ඔවුන්ගේ වත්මන් ජීවනෝපාය තත්ත්වයන්, ආදායම් සුරක්ෂිතතාව සහ ආර්ථික කම්පනවලට ඔරොත්තු දීමට ඇති හැකියාව " වටහා ගැනීමට වඩාත් පරිපූර්ණ ඇගයීමක් අවශ්‍ය වේ. රජයේ දෙවන වසර තුළ, ප්‍රතිලාභී ජනගහනය අඩුවීම සම්බන්ධයෙන් විපක්ෂ නායකවරයා විසින් පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කළ අතර, ඊට පිළිතුරු දෙමින් මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය අනිල් ජයන්ත මහතා ප්‍රකාශ කළේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව මිලියන 2.4 සිට මිලියන 1.2 දක්වා පහත වැටී ඇති බවයි. මෙම තත්ත්වය දිළිඳුකම සහ සමාජ ආරක්ෂණ කෝණයෙන් වඩාත් සමීපව අධීක්ෂණය කළ යුතුය. මෙහිදී මතු වන ප්‍රධාන අධීක්ෂණ සහ ඇගයීම් ප්‍රශ්නය වන්නේ වැඩසටහනෙන් ඉවත් වී ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද යන්න පමණක් නොව, ඉවත් වූවන් තම ජීවනෝපායන්හි තිරසාර දියුණුවක් අත්කර ගෙන තිබේද සහ ඔවුන් තවදුරටත් දිළිඳුකමට ගොදුරු වීමේ අවදානමක් නොපවතින්නේද යන්නයි.

එබැවින්, ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව අඩුවීම සමඟ විධිමත් ප්‍රතිඵල සහ බලපෑම් ඇගයීමක් සිදුවිය යුතුය. එවැනි ඇගයීමකින් හිටපු ප්‍රතිලාභීන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය, ගෘහස්ථ ආදායම සහ වියදම, රැකියා සහ ජීවනෝපාය තත්ත්වයන්, ආහාර සුරක්ෂිතතාව, ණයගැතිභාවය, අත්‍යවශ්‍ය සේවාවන් සඳහා ඇති ප්‍රවේශය සහ අනාගත ආර්ථික කම්පනයන් හමුවේ ඔවුන්ගේ ඔරොත්තු දීමේ හැකියාව පරීක්ෂා කළ යුතුය. තවද, ඉලක්කගත කිරීමේ සහ තේරීමේ යාන්ත්‍රණයන් මඟින් සමාජ ආධාර අවශ්‍යතාවයේ පසුවන ගෘහ ඒකක නිවැරදිව හඳුනා ගන්නේද යන්නත් එහිදී ඇගයීමට ලක්කළ යුතුය. එවැනි සාක්ෂි හඳුනා ගැනීමකින් තොරව, ප්‍රතිලාභීන් සංඛ්‍යාව අඩුවීම මඟින් ගෘහස්ථ සුබසාධනයේ සැබෑ දියුණුවක් අවන්කවම පිළිබිඹු වීමට අමතරව සුදුසුකම්, ඉලක්කගත කරන ආකාරය මෙන් ම පරිපාලනමය ක්‍රියාවලීන්ගේ වෙනස්කම් ද පිළිඹිමු විය හැකිය.

මෙම නිරීක්ෂණය 2026 ජනවාරි-ජූනි ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණයේ පුළුල් සොයාගැනීම් සමඟ අනුකූල වේ. ක්ෂේත්‍ර ගණනාවක් පුරා, ප්‍රතිපත්ති, ව්‍යවස්ථා සම්පාදනය, වැඩසටහන්, අයවැය වෙන්කිරීම් සහ ආයතනික යාන්ත්‍රණයන් හරහා රජයේ ක්‍රියාමාර්ග පැහැදිලිව දක්නට ලැබේ. කෙසේ වෙතත්, ප්‍රතිදානයන්, ප්‍රතිඵල සහ දීර්ඝ කාලීන බලපෑම් පෙන්නුම් කරන විශ්වාසදායී සාක්ෂි පවතින්නේ සීමිත මට්ටමකය. වියදම් සහ වැඩසටහන් ආවරණය හරහා රජයේ ක්‍රියාමාර්ගවල සාර්ථකභාවය මැනීමෙන් ඔබ්බට ගොස්, එම මැදිහත්වීම් මඟින් ජනතාවගේ ජීවිතවල තිරසාර දියුණුවක් ඇති කරන්නේද යන්න ඇගයීම වෙත යොමුවීමේ අවශ්‍යතාව අස්වැසුම පිළිබඳ අත්දැකීමෙන් පැහැදිලි වන්නකි.

එබැවින්, දිළිඳුකම පිටුදැකීම සහ සමාජ ආරක්ෂණ වැඩසටහන් සඳහා වන අධීක්ෂණ සහ ඇගයීම් රාමුව ශක්තිමත් කරන ලෙස මෙම අධීක්ෂණය මඟින් රජයට යෝජනා කරයි. කලින් කලට සිදුකරන ඇගයීම් මඟින් ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ මුදල් වෙන්කිරීම පිළිබඳ පමණක් නොව, ගෘහස්ථ දිළිඳුකම, ජීවනෝපායන්, ආදායම් සුරක්ෂිතතාව සහ බලපෑමට ලක්වීමේ හැකියාවන් හි වෙනස්කම් ද නිරීක්ෂණය කළ යුතුය. සමාජ ආරක්ෂණ වැඩසටහන්වලින් ඉවත් වන ගෘහ ඒකක කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර, ඔවුන් ඉවත් වීම මඟින් දිළිඳුකමින් තිරසාර ලෙස මිදීමක් නිරූපණය කරන්නේද නැතහොත් අඛණ්ඩ අවදානම් තත්ත්වයක් නිරූපණය කරන්නේද යන්න තීරණය කළ යුතුය. එවැනි සාක්ෂි විනිවිදභාවයෙන් යුතුව ප්‍රසිද්ධ කිරීම මඟින් වගවීම ශක්තිමත් වන අතර, ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ස්වාධීන ඇගයීමකට මග පාදයි. එමෙන්ම දිළිඳුකම අවම කිරීමේදී අත්කර ගත් සැබෑ ප්‍රගතිය තීරණය කිරීම සඳහා වඩාත් විශ්වාසදායී පදනමක් ද එතුළින් සපයනු ලබයි.

සන්ස්ලේෂනාත්මකව ගත් කළ, 2026 ජනවාරි - ජූනි අධීක්ෂණය මඟින් පෙන්නුම් කරන්නේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළත් පොරොන්දු ක්‍රියාවට නැංවීම අසමාන ලෙස සිදුවන බවයි. ප්‍රතිපත්ති සංවර්ධනය, ව්‍යවස්ථා සම්පාදනය, වැඩසටහන් සහ ආයතනික සංවිධානය කිරීම් කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කර ඇති නමුත්, ක්ෂේත්‍ර කිහිපයකම ස්පර්ශණීය ප්‍රතිඵල පිළිබඳ සාක්ෂි ප්‍රමාණවත් නොවේ. එබැවින් මීළඟ අධීක්ෂණ අදියරේදී, විශ්වාසදායී සහ තහවුරු කළ හැකි තොරතුරු කාලෝචිත ලෙස ප්‍රසිද්ධ කිරීමේ සහාය ඇතිව, මැනිය හැකි ඉලක්ක, ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිදානයන්, අයවැය භාවිතය, ප්‍රතිලාභී ආවරණය, ප්‍රතිඵල සහ බලපෑම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. රාජ්‍ය වාර්තාකරණය, විනිවිදභාවය, කරුණු විමසීම සහ ස්වාධීන අධීක්ෂණය ශක්තිමත් කිරීම මඟින් රජයේ ක්‍රියාමාර්ග හරහා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ලබා දී ඇති පොරොන්දු ජනතාවගේ ජීවිතවල ස්පර්ශණීය දියුණුවක් බවට පරිවර්තනය වන්නේද යන්න වඩා හොඳින් ඇගයීමට පුරවැසියන්ට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට මේ ඔස්සේ හැකියාව ලැබේ.

## ආපදා කළමනාකරණය පිළිබඳ රජයේ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැන්වීම

ආපදා කළමනාකරණය පිළිබඳ රජයේ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැන්වීම: මෙම වාර්තාව මඟින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එන ආපදා සම්බන්ධ පොරොන්දු 13ක් සහ ආපදා කෙරෙහි අවධානය යොමු කරමින් ජාතික ප්‍රතිපත්ති රාමුවේ ඇතුළත් කොට ඇති පොරොන්දු 10ක් හඳුනා ගන්නා අතර, ඉන් 05ක් සෘජුවම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ලබාගත් ඒවා වේ. 2026 ජනවාරි-ජූනි කාලය තුළ, කැබිනට් තීරණ මඟින්; කෘෂිකාර්මික හා වතු ක්ෂේත්‍රයේ යථා තත්ත්වයට පත්කිරීම්, ආපදා සූදානම සහ විද්‍යාත්මක පදනම සහිත ඔරොත්තු දීමේ හැකියාව, හදිසි සන්නිවේදනය සහ පූර්ව අනතුරු ඇඟවීමේ ධාරිතාව, නායයාම් අවදානම් අවම කිරීම සහ සුරක්ෂිත නිවාස, ජීවනෝපාය පුනරුත්ථාපනය සහ තාවකාලික නිවාස, කාලගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ පාරිසරික ආරක්ෂණය, සහ මානුෂීය ආධාර හා නැවත ගොඩනැගීම් කෙරෙහි අවධානය යොමු කරන ලදී. "වඩා හොඳින් නැවත ගොඩනැගීම" (Build Back Better) යන ප්‍රවේශය යටතේ, කැබිනට් මණ්ඩලය විසින් රුපියල් බිලියන 515.46ක් ලෙස තක්සේරු කරන ලද 'දිට්වා' සුළි කුණාටුවෙන් පසු යථා තත්ත්වයට පත්කිරීමේ ව්‍යාපෘති 1,028ක් සහ රුපියල් බිලියන 102.22ක් ලෙස තක්සේරු කරන ලද පළාත් සභා ව්‍යාපෘති 38ක් අනුමත කරන ලදී. දිට්වා කුණාටුවෙන් පසු පුනරුත්ථාපනය සඳහා රජය විසින් රුපියල් බිලියන 500ක අතිරේක විසර්ජන ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලදී (යටිතල පහසුකම් නැවත ගොඩනැගීමට රු. බිලියන 250ක්, ජීවනෝපාය සහ ව්‍යාපාර සඳහා රු. බිලියන 150ක්, සහ නිවාස හා සෘජු සහන සඳහා රු. බිලියන 100ක්). 2026 ජූනි 30 වන විට, රුපියල් බිලියන 243.9ක් (48.8%) භාවිත කර තිබුණි. මෙම ප්‍රධාන කාණ්ඩ තුන යටතේ වෙන් වෙන් වශයෙන් සිදු කළ රාජ්‍ය වියදම් වර්ගීකරණයන් ප්‍රසිද්ධියට පත් කර නොතිබුණි.

## නිර්දේශ

1. රජයේ අධීක්ෂණ සහ වාර්තාකරණ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම
2. ප්‍රතිඵල මත පදනම් වූ අධීක්ෂණ සහ ඇගයීම් රාමුවක් ස්ථාපිත කිරීම..
3. ජාතික දූෂණ විරෝධී ක්‍රියාකාරී සැලැස්ම (NACAP) ක්‍රියාත්මක කිරීම පිළිබඳ වාර්ෂික මහජන සමාලෝචනයක් ආරම්භ කිරීම..
4. සාක්ෂි මත පදනම් වූ සහ බහුපාර්ශ්වීය සහභාගීත්වයෙන් යුත් ප්‍රතිපත්ති සම්පාදනය ආයතනගත කිරීම.
5. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (RTI) සක්‍රීයව සහ කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම, සහ
6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණවලදී ප්‍රජාතන්ත්‍රවාදය සහ පාලනය සම්බන්ධ කැපවීම් සඳහා ප්‍රමුඛතාව ලබා දීම.

ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ස්වාධීන අධීක්ෂණය රජයේ ධූර කාලය මුළුල්ලේම පැෆරල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය විසින් අඛණ්ඩව සිදුකරනු ලබන අතර, ඉදිරි අදියරයන්හිදී විශේෂයෙන්ම පොරොන්දු ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් ලෙස සම්පත් වෙන්කර තිබේද, ඒවා සක්‍රීයව ක්‍රියාත්මක වන්නේද, සහ අවසානයේ පුරවැසියන් උදෙසා ස්පර්ශ කළ හැකි සහ මැනිය හැකි ප්‍රතිලාභ බවට පරිවර්තනය වන්නේද යන්න කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ.

***ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණයේ අර්ධ වාර්ෂික වාර්තා කියවීම සඳහා QR කේතය ස්කෑන් කරන්න:***

**පළමු අර්ධ වාර්ෂික වාර්තාව** | **දෙවන අර්ධ වාර්ෂික වාර්තාව** | **තෙවන අර්ධ වාර්ෂික වාර්තාව**

***වැඩිදුර තොරතුරු සඳහා:***

පැෆරල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය
නො. 16, බර්ඩ් පෙදෙස, පාමංකඩ පාර අසල, කොළඹ 06 | +94 11 255 8570/71 | paffrel@sltnet.lk